ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 දෙසැම්බර් මස 24 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 ඔක්තෝබර්

### සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තුළ මෑතකදී දක්නට ලැබුණු පීඩනය 2018 ඔක්තෝබර් මාසයේ දී ද පැවතිණි. ආනයන වියදම ඉහළ යෑමත් සහ අපනයන සුළු වශයෙන් වැඩිවීමත් හේතුකොට ගෙන ඔක්තෝබර් මාසයේ දී වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය. කෙසේ වුවත්, ඇතැම් ආනයන මත මෑතකදී පැන වූ යම් සීමා කිරීම්වල බලපෑම් හේතුවෙන් ඉදිරි මාස කිහිපය තුළදී ආනයන වැඩිවීමේ ප්‍රවණතාවය පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ඔක්තෝබර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හිතකර වර්ධනයක් වාර්තා කළ අතර, සංචාරක ඉපැයීම්වල සුළු වර්ධනයක් දක්නට ලැබුණි. මූල්‍ය ගිණුම තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ආපසු රැගෙන යෑම් දක්නට ලැබුණි. එලෙස විදේශ විනිමය ගලා යෑම් සහ ආනයන වියදම් ගෙවීම් හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත පීඩනයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසරේ පළමු මාස දහය තුළදී ශ්‍රී ලංකා රුපියල සියයට 12.3 කින් අවප්‍රමාණය විය. දළ නිල සංචිත ප්‍රමාණය සැප්තැම්බර් මස අවසානයේ පැවති එ.ජ. ඩොලර් බිලියන 7.2 සිට ඔක්තෝබර් මස අවසානයේදී එ.ජ. ඩොලර් බිලියන 7.9 දක්වා ඉහළ ගියේය. ඒ සඳහා එ.ජ. ඩොලර් බිලියන 1 ක් වූ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම ලැබීම ප්‍රධාන වශයෙන් දායක විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 ඔක්. (එ.ජ. ඩො. මිලියන) | 2018 ඔක්. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන -ඔක්. (එ.ජ. ඩො. මිලියන) | 2018 ජන -ඔක්. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 976 | 979 | 0.4 | 9,400 | 9,877 | 5.1 |
| ආනයන | 1,727 | 1,882 | 9.0 | 16,991 | 18,734 | 10.3 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -752 | -903 | | -7,591 | -8,857 | |
| සංචාරක ඉපැයීම් | 283 (ආ) | 284 (ඇ) | 0.5 | 3,161 (ආ) | 3,496 (ඇ) | 10.6 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 546 (ඈ) | 599 | 9.7 | 5,904 (ඈ) | 5,876 | -0.5 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | 13 | -36 | | 279 | 0.9 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) (ඊ) | 260 | 1,152 | | 4,857 | 5,321 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 142 | 17 | | 1,403 | 698 | |
| දිගුකාලීන ණය (ඊ) | 118 | 135 | | 954 | 1,123 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | - | 1,000 | | 1,000 | 1,000 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500 | 2,500 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 167 | 252 | |
| විදේශීය සෘජු ආයෝජන (උ) | | | | 693 | 1,801 | |
| සමස්ත ශේෂය | | | | 1,991 | -157 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය

(ඈ) සංශෝධිත

(ඉ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ

(ඊ) රජයේ දිගුකාලීන විදේශ ණය සඳහා වූ මාසික දත්ත සැප්තැම්බර් මාසය සඳහාත්, සමුච්චිත දත්ත පළමු මාස නවය සඳහාත් පමණක් පවතියි

(උ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ ශේෂය

ආනයනවල ඉහළ වර්ධනය හේතුවෙන් 2018 ඔක්තෝබර් මාසයේදී වෙළඳ හිඟය 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පුළුල් විය. 2018 වසරේ පළමු මාස දහය තුළ සමුච්චිත වෙළඳ හිඟය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුළුල් විය.

**රූප සටහන 1: මාසික ආනයන-අපනයන ක්‍රියාකාරිත්වය 2018**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

රූප සටහන 2 : මාසික අපනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 ඔක්තෝබර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 979 ක් දක්වා සියයට 0.4 කින් ඉහළ ගියේය. කාර්මික අපනයන සියයට 4.5 කින් වර්ධනය වුවත්, කෘෂිකාර්මික අපනයන සියයට 11.5 කින් පහත වැටීම තුළින් මෙම මාසයේ අපනයන වර්ධනය පහළ අගයක් වාර්තා කළේය. කාර්මික අපනයන සැලකුවිට, ඇඟළුම් අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටුණ ද රෙදිපිළි අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් 2018 ඔක්තෝබර් මාසයේ දී රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම සුළු වශයෙන් ඉහළ ගියේය. ඇඟළුම් අපනයන සඳහා යුරෝපා වෙළඳපොළ සහ ඉන්දියාව, කැනඩාව, ජපානය සහ හොංකොං වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම ඉහළ ගිය ද ප්‍රධාන වශයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම පහත වැටීම හේතුවෙන් ඇඟළුම් අපනයන ආදායම පහත වැටුණි. තවද ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන, පරිමාව හා මිළ යන දෙඅංශයෙන්ම ඉහළ යෑම හේතුවෙන් 2018 ඔක්තෝබර් මාසයේදී ඉහළ අගයක් වාර්තා කළේය. එමෙන්ම ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, ඒ සඳහා එම අපනයන යටතේ වර්ග කර ඇති කාණ්ඩ බොහෝමයක ඉහළ ක්‍රියාකාරීත්වය හේතු විය. මීට අමතරව, 2018 ඔක්තෝබර් මාසයේදී කාර්මික අපනයන ඉහළ යෑමට දායක වෙමින් සත්ත්ව ආහාර, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ යන අංශයන්හි අපනයන ආදායම වර්ධනය විය. කෙසේ වුවද, 2018 ඔක්තෝබර් මාසයේදී රබර් නිෂ්පාදිත, මැණික දියමන්ති හා ස්වර්ණාභරණ සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් නිෂ්පාදිත ආශ්‍රිත අපනයන ආදායම පහත වැටුණි. මේ අතර, මුහුදු ආහාර, එළවළු සහ රබර් අපනයන හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති අනෙකුත් කාණ්ඩ සියල්ලකම පාහේ වාර්තා වූ පහළ කාර්යසාධනයන් හේතුවෙන් මෙම මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. තේ අපනයනයන්හි මිල සාමාන්‍ය සහ පරිමාව පහත වැටීම පිළිබිඹු කරමින් 2018 ඔක්තෝබර් මාසයේදී තේ අපනයන ආදායම පහත වැටුණි. කුළු බඩු යටතේ වර්ග කර ඇති බොහෝ කාණ්ඩවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙම මාසය තුළදී කුළු බඩු අපනයන අදායාම පහත වැටුණි. තවද පොල් මද ආශ්‍රිත නොවන පොල් අපනයන අදායම වර්ධනය වුවද, දිසිදි පොල් සහ පොල්තෙල් වැනි පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් පොල් අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, මෙම මාසය තුළදී යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ

ඉහළ අපනයන හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම වර්ධනය විය. 2018 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේ, වෙළෙඳ භාණ්ඩ සඳහා ප්‍රධාන වෙළඳපොළ බවට ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඉතාලිය සහ ජර්මනිය පත් වූ අතර, එම රටවල් වෙත සිදු කරන ලද අපනයන වටිනාකම මුළු අපනයන ආදායමෙන් සියයට 50 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2017 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | 2018 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-ඔක්. (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **725.0** | **757.4** | **4.5** | **7,032.1** | **7,657.0** | **8.9** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 35.1 | 42.7 | 21.7 | 331.4 | 389.9 | 17.7 |
| සත්ත්ව ආහාර | 5.8 | 8.3 | 43.2 | 62.2 | 91.1 | 46.5 |
| රෙදිපිළි හා ඇඟලුම් | 422.6 | 426.6 | 0.9 | 4,137.6 | 4,354.5 | 5.2 |
| එයින් ඇඟලුම් | 399.7 | 395.8 | -1.0 | 3,895.2 | 4,062.7 | 4.3 |
| රෙදිපිළි | 15.2 | 23.0 | 51.5 | 170.3 | 213.4 | 25.3 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.7 | 7.8 | 0.9 | 72.2 | 78.4 | 8.6 |
| රබර් නිෂ්පාදිත | 78.8 | 71.4 | -9.4 | 693.5 | 727.6 | 4.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 25.8 | 24.3 | -5.7 | 214.2 | 238.8 | 11.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 35.1 | 35.8 | 2.1 | 312.5 | 364.2 | 16.5 |
| ප්‍රවාහන උපකරණ | 6.3 | 7.1 | 14.0 | 151.0 | 105.4 | -30.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 34.9 | 58.5 | 67.5 | 327.8 | 512.3 | 56.3 |
| රසායනික නිෂ්පාදිත | 14.0 | 13.6 | -2.9 | 122.2 | 141.6 | 15.9 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.6 | 12.5 | 8.4 | 114.6 | 116.9 | 2.0 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.7 | 1.5 | -59.2 | 37.9 | 24.8 | -34.5 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 11.0 | 9.1 | -16.9 | 131.4 | 128.2 | -2.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.2 | 6.6 | 6.9 | 59.7 | 63.9 | 7.1 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 8.5 | 15.0 | 75.4 | 93.9 | 138.5 | 47.5 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.0 | 2.7 | -9.5 | 28.1 | 26.7 | -5.0 |
| වෙනත් | 22.7 | 21.5 | -5.3 | 214.1 | 232.6 | 8.6 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **245.6** | **217.3** | **-11.5** | **2,323.4** | **2,175.0** | **-6.4** |
| තේ | 136.2 | 115.5 | -15.2 | 1275.9 | 1208.2 | -5.3 |
| රබර් | 1.8 | 2.4 | 31.7 | 33.4 | 27.5 | -17.5 |
| පොල් | 30.1 | 28.6 | -5.2 | 303.3 | 266.7 | -12.1 |
| කුළුබඩු | 42.4 | 33.2 | -21.7 | 339.9 | 302.5 | -11.0 |
| එළවළු | 2.5 | 3.0 | 20.5 | 24.6 | 23.9 | -2.9 |
| සකස් නොකළ දුම්කොළ | 2.9 | 2.5 | -13.6 | 29.6 | 29.2 | -1.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.4 | 8.7 | -7.4 | 120.4 | 102.5 | -14.8 |
| මුහුදු ආහාර | 20.2 | 23.3 | 15.7 | 196.3 | 214.4 | 9.2 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **4.9** | **4.4** | **-9.2** | **44.5** | **44.7** | **0.4** |
| **මුළු අපනයන** | **975.6** | **979.1** | **0.4** | **9,400.0** | **9,876.7** | **5.1** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

රූප සටහන 3 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 ඔක්තෝබර් මාසයේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,882 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 9.0 කින් ඉහළ ගියේය. අන්තර් භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන ප්‍රධාන උප කාණ්ඩයන්හි වර්ධනය ඒ සඳහා දායක වී ඇත. රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඉන්ධන සහ තිරිඟු හා ඉරිඟු ආනයනය ඉහළ යෑම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම රෙදිපිළි වර්ග සහ නූල් වර්ග ආනයනය ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව පහත වැටුණ ද, බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජතෙල් යන දෙකෙහිම ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව මෙම මාසයේදී තිරිඟු හා ඉරිඟු, රසායනික නිෂ්පාදිත, පොහොර, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 අප්‍රේල් මාසයේ සිට රත්‍රන් ආනයන මත පැනවූ තීරුබදු හා සම්බන්ධ බලපෑම පිළිබිඹු කරමින් 2018 ඔක්තෝබර් මාසයේදී රත්‍රන් ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. තවද පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන සිලින්ඩර ධාරිතාව 1,500 අඩු කාණ්ඩයේ මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් මෝටර් රථ ආනයනය ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 සැප්තැම්බර් මාසයේදී හඳුන්වාදුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්හි බලපෑම හේතුවෙන් ඉදිරි මාසවලදී රථවාහන ආනයනය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර ප්‍රමාණවත් දේශීය සහල් සැපයුමක් පැවතීම පිළිබිඹු කරමින් මෙම මාසය තුළදී සහල් ආනයන වියදම පහත වැටුණි. අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සීමා කිරීම සහ සාපේක්ෂව ඉහළ විනිමය අවප්‍රමාණයේ බලපෑම පිළිබිඹු කරමින් 2018 ඔක්තෝබර් මාසයේදී රෙදිපිළි හා උපාංග, විදුලි සංදේශ මෙවලම්, ගෘහ හා දැව භාණ්ඩ සහ ගෘහ උපකරණ වැනි ඇතැම් කාණ්ඩවල ආනයන වියදම පහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2018 ඔක්තෝබර් මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, ටැංකි හා බවුසර, ලොරි රථ, බස් රථ සහ කැබ් රථ වැනි වාණිජ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථ වාහන ආනයනය පහත වැටීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහත වැටුණි. 2018 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය කළ ප්‍රධාන රටවල් ලෙස චීනය, ඉන්දියාව, සිංගප්පූරුව, ජපානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය පැවති අතර, එම රටවලින් සිදු කළ ආනයන සමස්ත ආනයන වියදමෙන් සියයට 61 ක් පමණ විය.

# සංඛ්‍යා සටහන 3 : වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | 2018 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-ඔක්. (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **382.2** | **438.5** | **14.7** | **3,661.2** | **4,259.1** | **16.3** |
| ආහාර හා පාන වර්ග | 148.9 | 121.2 | -18.6 | 1,484.6 | 1,360.4 | -8.4 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය හා ආශ්‍රිත නිෂ්පාදිත | 37.8 | 2.5 | -93.3 | 245.9 | 118.0 | -52.0 |
| එයින් සහල් | 36.5 | 1.0 | -97.3 | 234.9 | 102.5 | -56.3 |
| කිරි නිෂ්පාදිත | 23.9 | 29.5 | 23.3 | 250.3 | 273.6 | 9.3 |
| එළවළු | 24.4 | 20.6 | -15.6 | 288.0 | 256.1 | -11.1 |
| සීනි හා රසකැවිලි | 14.2 | 13.4 | -5.8 | 213.7 | 210.1 | -1.7 |
| කුළුබඩු | 7.7 | 11.2 | 45.7 | 78.0 | 95.6 | 22.6 |
| පාන වර්ග | 6.6 | 9.6 | 44.2 | 67.1 | 73.8 | 10.1 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 34.2 | 34.5 | 0.8 | 341.6 | 333.2 | -2.5 |
| **ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | **233.3** | **317.3** | **36.0** | **2,176.6** | **2,898.7** | **33.2** |
| පෞද්ගලික රථවාහන | 54.8 | 160.8 | 193.2 | 615.2 | 1,391.4 | 126.2 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 48.7 | 48.6 | -0.3 | 423.3 | 442.1 | 4.4 |
| ගෘහ උපකරණ | 26.3 | 23.0 | -12.6 | 216.2 | 199.3 | -7.8 |
| රෙදිපිළි හා උපාංග | 34.6 | 22.8 | -34.2 | 319.1 | 260.1 | -18.5 |
| විදුලි සංදේශ මෙවලම් | 25.4 | 19.7 | -22.2 | 222.7 | 226.8 | 1.8 |
| ගෘහ හා දැව භාණ්ඩ | 19.2 | 14.6 | -24.0 | 152.6 | 143.6 | -5.9 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 24.2 | 27.8 | 15.0 | 227.5 | 235.5 | 3.5 |
| **2. අන්තර් භාණ්ඩ** | **948.4** | **1017.5** | **7.3** | **9,169.6** | **10,430.3** | **13.7** |
| ඉන්ධන | 236.9 | 265.9 | 12.3 | 2,688.2 | 3,431.0 | 27.6 |
| එයින් බොරතෙල් | 41.6 | 62.0 | 49.1 | 512.6 | 776.0 | 51.4 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 176.1 | 200.9 | 14.1 | 1,982.2 | 2,504.6 | 26.4 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 79.5 | 13.2 | -83.3 | 594.3 | 542.9 | -8.7 |
| එයින් රත්‍රන් | 63.3 | 0.5 | -99.2 | 498.0 | 438.6 | -11.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 242.1 | 279.7 | 15.5 | 2,240.6 | 2,371.3 | 5.8 |
| රසායනික නිෂ්පාදිත | 76.7 | 90.1 | 17.4 | 690.0 | 761.1 | 10.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 58.4 | 64.0 | 9.5 | 516.1 | 585.8 | 13.5 |
| තිරිඟු හා ඉරිඟු | 31.1 | 53.9 | 73.1 | 295.7 | 326.6 | 10.5 |
| මූල ලෝහ | 43.4 | 46.6 | 7.4 | 462.6 | 519.8 | 12.4 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 46.1 | 46.6 | 1.1 | 399.7 | 441.3 | 10.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 24.3 | 32.2 | 32.6 | 240.6 | 228.8 | -4.9 |
| පොහොර | 10.6 | 23.1 | 118.5 | 81.8 | 210.9 | 158.0 |
| ආහාර සැකසුම් | 22.8 | 20.2 | -11.6 | 245.8 | 254.2 | 3.4 |
| වෙනත් | 76.4 | 81.9 | 7.2 | 714.3 | 756.7 | 5.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **392.5** | **425.7** | **8.5** | **4,016.2** | **3,970.4** | **-1.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 205.6 | 233.5 | 13.5 | 2,147.4 | 2,112.1 | -1.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 125.2 | 138.7 | 10.8 | 1,302.9 | 1,279.4 | -1.8 |
| ප්‍රවාහන උපකරණ | 61.2 | 53.1 | -13.3 | 559.0 | 573.8 | 2.6 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.5 | 0.0 | 6.8 | 5.1 | -25.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **4.1** | **0.7** | **-82.8** | **143.9** | **73.7** | **-48.8** |
| **මුළු ආනයන** | **1727.2** | **1882.5** | **9.0** | **16,990.9** | **18,733.5** | **10.3** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

2018 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 284 ක් වූ සංචාරක ඉපැයීම් සමග 2018 වසරේ පළමු මාස දහයේ දී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 3,496 ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, චීනය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවලින් පැමිණි සංචාරකයින්ගේ අඩුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2018 ඔක්තෝබර් මාසයේ දී සංචාරක පැමිණීමේ වර්ධනය සියයට 0.5 ක් වශයෙන් වාර්තා විය. 2018 වසරේ පළමු මාස දහය තුළදී මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය 2,080,627 ක් වූ අතර, එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට වඩා සියයට 11.2 ක වර්ධනයකි. මේ අතර, 2018 ඔක්තෝබර් මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 599 ක් වූ අතර, එය සියයට 9.7 ක වාර්ෂික වර්ධනයකි. පෙර වර්ෂය සමග සැසදීමේදී අඛණ්ඩව මාස පහක් පුරා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සුළු වශයෙන් පහළ යෑමක් දක්නට ලැබුණ පසුබිමක, ඔක්තෝබර් මාසයේ මෙම ඉහළ යෑම සැලකිය යුතු වර්ධනයකි. ඒ අනුව, වසරේ පළමු මාස දහය තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල පහළ යෑම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.5 ක් වූ අතර, 2018 පළමු මාස දහය තුළදී ප්‍රේෂණ ලෙස එ.ජ. ඩොලර් මිලියන 5,876 ක් ලැබුණි.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




**මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**බලපත්‍රලාභී වාණිජ බැංකු**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

## මූල්‍ය ලැබීම්

රජය වෙත ලැබුණු එ.ජ. ඩොලර් බිලියන 1 ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, ඔක්තෝබර් මාසය තුළ මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම වේ. කෙසේ වෙතත් කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන සැලකිය යුතු ලෙස ඉවත් කර ගැනීමත් සමඟ 2018 ඔක්තෝබර් මාසය තුළදී මූල්‍ය ගිණුම

වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීමේ ප්‍රවණතාවය තවදුරටත් දක්නට ලැබුණි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන්, ඔක්තෝබර් මාසය තුළදී එ.ජ. ඩොලර් මිලියන 172 ක ආයෝජන ශුද්ධ වශයෙන් පිටතට ගලා යෑමක් වාර්තා වූ අතර, ඒ සමඟ 2018 වසරේ පළමු මාස දහය අවසන් වන විට රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත ශුද්ධ ආයෝජන ගලා යෑම් එ.ජ. ඩොලර් මිලියන 640 දක්වා ඉහළ ගියේය. මේ අතර, ද්විතීයික හා ප්‍රාථමික වෙළඳපොළ විදේශ විනිමය ගනුදෙනු අන්තර්ගත කොළඹ කොටස් වෙළඳපොලෙහි විදේශීය ආයෝජන 2018 ඔක්තෝබර් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 36 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. ඒ අනුව, 2018 වසරේ පළමු මාස දහය තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ සමුච්චිත ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1 ක් වූ අතර, එය ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 77 ක ලැබීමකින් සහ ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 76 ක ශුද්ධ ගෙවීමකින් සමන්විත විය.

## ජාත්‍යන්තර සංචිත

2018 ඔක්තෝබර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 7.9 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ආනයනික මාස 4.2 කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2018 ඔක්තෝබර් අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.4 ක් වූ අතර, එය ආනයනික මාස 5.5 කට සමාන විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

2018 වසරේ දෙසැම්බර් මස 21 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 15.5 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අවප්‍රමාණය විය. සමස්තයක් වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ.ඩොලරය ශක්තිමත් වීම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ආයෝජන පිටතට ගලා යෑම් සහ ආනයන ගෙවීම් වෙනුවෙන් විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති ඉල්ලුම, එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම කෙරෙහි වැඩි වශයෙන් බලපෑවේය.

**රූප සටහන 7 :**

**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**

**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 | 2018 (දෙසැ. 21 දක්වා) අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.0% | -15.5% |
| යුරෝ | -13.5% | -11.9% |
| ස්ටර්ලින් පවුම | -10.5% | -10.2% |
| ජපන් යෙන් | -5.1% | -16.6% |
| කැනේඩියානු ඩොලරය | -8.6% | -9.2% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -9.0% | -7.5% |
| ඉන්දියානු රුපියල | -7.5% | -7.7% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව